# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,143 - 2019 සැප්තැම්බර් මස 27 වැනි සිකුරාදා - 2019.09.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහේස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | — |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 596 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2019 ඔක්තෝබර් මස 18 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 ඔක්තෝබර් මස 04 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

595 - B 081563 — 353 (2019/09)
D 1 -

# විවිධ දැන්වීම්

## 1907 අංක 19 දරන විවාහ (සාමාන්‍ය) ආඥාපනත සංශෝධනය කිරීම උදෙසා වූ පනතකි

පාර්ලිමේන්තු මන්ත්‍රී අතුරලියේ රතන හිමි වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 53 (1) යටතේ "1907 අංක 19 දරන විවාහ (සාමාන්‍ය) ආඥාපනත සංශෝධනය කිරීම උදෙසා වූ පනතකි'' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී 1907 අංක 19 දරන විවාහ (සාමාන්‍ය) ආඥාපනත සංශෝධනය කිරීමයි :-

1. ශ්‍රී ලාංකිකයන් සැම දෙනාම එක් පොදු නීති පද්ධතියකට අනුගත කිරීම තුලින් සැමට එක නීතියක් දායාද කිරීම ;

2. ප්‍රදේශ හා ජාතීන් පදනම් කරගත් විශේෂ නීති නිසා නීතිය ඉදිරියේ සියල්ලන් එක හා සමානය යන නියමය බණ්ඩනය වී ඇති බැවින් එය යලි ස්ථාපිත කිරීම ;

3. ප්‍රදේශ හා ජාතීන් පදනම් කරගත් විවාහ හා දික්කසාද නීති හේතුවෙන් පීඩාවට පත් වින්දිතයන්ට හා පොදුවේ ශ්‍රී ලාංකිකයන්ට සාධාරණය ඉටු කිරීම,

යනාදිය වේ.

පූජ්‍ය අතුරලියේ රතන ස්ථවිර,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

''සදහම් සෙවන''
ගෝතමී උයන,
රාජගිරිය.

09-1000/1

---

## 1951 අංක 13 දරන මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥාපනත සංශෝධනය කිරීම උදෙසා වූ පනතකි

පාර්ලිමේන්තු මන්ත්‍රී අතුරලියේ රතන හිමි වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 53 (1) යටතේ "1951 අංක 13 දරන මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥාපනත සංශෝධනය කිරීම උදෙසා වූ පනතකි'' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථ වලින් යුක්ත වන්නා වූ එකී 1951 අංක 13 දරන මුස්ලිම් විවාහ හා දික්කසාද ආඥාපනත සංශෝධනය කිරීමයි :-

1. ශ්‍රී ලාංකිකයන් සැම දෙනාම එක් පොදු නීති පද්ධතියකට අනුගත කිරීම තුලින් සැමට එක නීතියක් දායාද කිරීම ;

2. ප්‍රදේශ හා ජාතීන් පදනම් කරගත් විශේෂ නීති නිසා නීතිය ඉදිරියේ සියල්ලන් එක හා සමානය යන නියමය බණ්ඩනය වී ඇති බැවින් එය යලි ස්ථාපිත කිරීම ;

3. ප්‍රදේශ හා ජාතීන් පදනම් කරගත් විවාහ හා දික්කසාද නීති හේතුවෙන් පීඩාවට පත් වින්දිතයන්ට හා පොදුවේ ශ්‍රී ලාංකිකයන්ට සාධාරණය ඉටු කිරීම,

යනාදිය වේ.

පූජ්‍ය අතුරලියේ රතන ස්ථවිර,
පාර්ලිමේන්තු මන්ත්‍රී.

''සදහම් සෙවන''
ගෝතමී උයන,
රාජගිරිය.

09-1000/2

## 1952 අංක 44 දරන විවාහ හා දික්කසාද (උඩරට) ආඥාපනත සංශෝධනය කිරීම උදෙසා වූ පනතකි

පාර්ලිමේන්තු මන්ත්‍රී අතුරලියේ රතන හිමි වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 53 (1) යටතේ "1952 අංක 44 දරන විවාහ හා දික්කසාද (උඩරට) ආඥාපනත සංශෝධනය කිරීම උදෙසා වූ පනතකි'' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේදී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථ වලින් යුක්ත වන්නා වූ එකී 1952 අංක 44 දරන විවාහ හා දික්කසාද (උඩරට) ආඥාපනත සංශෝධනය කිරීමයි :-

1. ශ්‍රී ලාංකිකයන් සැම දෙනාම එක් පොදු නීති පද්ධතියකට අනුගත කිරීම තුලින් සැමට එක නීතියක් දායාද කිරීම ;

2. ප්‍රදේශ හා ජාතීන් පදනම් කරගත් විශේෂ නීති නිසා නීතිය ඉදිරියේ සියල්ලන් එක හා සමානය යන නියමය බණ්ඩනය වී ඇති බැවින් එය යලි ස්ථාපිත කිරීම ;

3. ප්‍රදේශ හා ජාතීන් පදනම් කරගත් විවාහ හා දික්කසාද නීති හේතුවෙන් පීඩාවට පත් වින්දිතයන්ට හා පොදුවේ ශ්‍රී ලාංකිකයන්ට සාධාරණය ඉටු කිරීම,

යනාදිය වේ.

පූජ්‍ය අතුරලියේ රතන ස්ථවිර,<br>
පාර්ලිමේන්තු මන්ත්‍රී.

''සදහම් සෙවන''<br>
ගෝතමී උයන,<br>
රාජගිරිය.

09-1000/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.